museum of modern
and contemporary art
sri lanka

**Quarterly Newsletter #8 – July 2024**

'අක්කර 88: මිනෙට් ද සිල්වා විසින් කළ වටපුළුව නිවාස යෝජනා ක්‍රමය' ප්‍රදර්ශනය ජූලි 7 වන දින අවසන් විය. රිවෙල් මාසලින්, තිනාල් සජීව, සහ නිමායා හැරිස්ගේ අභිරක්ෂක සහාය ඇතිව, ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරා විසින් අභිරක්ෂණය කළ මෙම ප්‍රදර්ශනය ශ්‍රී ලාංකීය ගෘහ නිර්මාණ ශිල්පී මිනෙට් ද සිල්වාගේ (1918–1998) පුරෝගාමී නිර්මාණ පිලිබඳ අභිරක්ෂණය කළ පළමු ජාත්‍යන්තර ඒකල ප්‍රදර්ශනය විය. මෙම ප්‍රදර්ශනය පාසැල් සහ අධ්‍යාපන ආයතන 856 ක සිසුන් ඇතුළු නරඹන්නන් 13,257ක් ආකර්ෂණය කරගත්තේ ය.

මෙම ප්‍රදර්ශනය නාභිගතවන්නේ මිනෙට් ද සිල්වා විසින් නිර්මාණ සැලසුම්කරණය කළ, 1958දී විවෘතකෙරුණු මහනුවර වටපුළුව නිවාස යෝජනා ක්‍රමය මතයි. මෙම යෝජනා ක්‍රමය ශ්‍රී ලංකාව තුළ සමාජ නිවාසකරණයේ නව ස්වරූපයක පෙරමඟ දැන්වූ අතර, විශේෂයෙන් ම එහි පරිශීලකයන්ගේ සහභාගීත්වයෙන් නිර්මාණයකෙරුණි. ශ්‍රී ලංකාවේ බහුවිධ වාර්ගික-ආගමික රාජ්‍ය සේවකයින් ප්‍රජාවකට දැරිය හැකි මිලකට නවාතැන් සපයා දුන් මෙම විශාල භූමි භාගයක විසිරුණු කඳුකර සංවර්ධනය, එම යුගයට පෙරටුව සිටියේ කෙසේදැයි යන්න 'අක්කර 88' ගවේෂණයකරයි. ඉරුෂි තෙන්නකෝන් (උ. 1989), සුමේධ කැලේගම (උ. 1988), සහ සුමුදු අතුකෝරල (උ. 1980) නිර්මාණයකළ විශේෂයෙන් පැවරුණු කලාකරුවන්ගේ චිත්‍රපටයක් සමඟින් 'අක්කර 88' මෙම යෝජනා ක්‍රමය දෙස වසර 65කට පසුව හැරී බලන්නේ ද සිල්වාගේ බලපෑම සහ ඇගේ නිර්මාණ ප්‍රවේශයේ අභියෝග සළකා බැලීමටයි.

සමකාලීන කලාව සමඟ සම්බන්ධ වීමේ ඇතිවන දුෂ්කරතා හඳුනාගනිමින්, සාමාන්‍ය ප්‍රේක්ෂකයාගේ දෘෂ්ටිකෝණයෙන් ප්‍රදර්ශනය දෙස බැලීමට අප සැමවිට ම උත්සාහ කළෙමු. මෙය සාක්ෂාත් කරගැනීමට අප සහභාගිවන්නන් 1,388ක් ආකර්ෂණය කරගත් නොමිලේ පැවැත්වුණු මහජන වැඩසටහන් 80ක් 'අක්කර 88' ට සමගාමීව පැවැත්වූවෙමු.

අපගේ තරුණ ප්‍රේක්ෂකයින් මගනොහරිමින්, MMCA Afterschool මෙම වසරේ ජනවාරි සහ ජූනි මාසයන් හිදී පැවැත්විණි. අසහාය වාස්තු විද්‍යාඥ මිනෙට් ද සිල්වා පිළිබඳ වැඩිදුරටත් ගවේෂණය කිරීමට ඉඩ සලසන සමාජ-චිත්තවේගීය ඉගෙනුම් ක්‍රියාකාරකම්වල නිරත වූ වයස අවුරුදු 6–10 අතර ළමුන් 160ක් අපි පිළිගත්තෙමු.

අපගේ ඉදිරි ප්‍රදර්ශනවලට යොමුවන අතරතුර, 'Arts 4 ADR' ව්‍යාපෘතිය යටතේ ජැස්මින් නිලානි ජෝසප් (උ.1990), අනෝමා රාජකරුණා (උ.1965) සහ හනුෂා සෝමසුන්දරම් (උ.1988) යන කලාකරුවන්ගේ නව පැවරීම් තුනක් පිළිබඳව ඔබට දැනුම්දීමට අපි සතුටු වෙමු. මෙම ප්‍රයතන්යේ අරමුණ වන්නේ කතිකාවත් ගොඩ නැගීමට, විවිධ ප්‍රජා එක්සත්

කිරීමට, ආවර්ජනයට පෙළඹවීමට, සහ ජනවාර්ගික ගැටුම් පවතින සන්දර්භ තුළ සංහිඳියාව සඳහා විකල්ප මං ඉදිරිපත් කිරීමට කලාවට ඇති හැකියාව ගවේෂණය කිරීමයි. මෙම කලාකරුවන් වවුනියාව, මන්නාරම, අම්පාර, ත්‍රිකුණාමලය, බදුල්ල, සහ මොනරාගල ප්‍රදේශවල ප්‍රජා සමග එක්ව කටයුතු කරමින් ශ්‍රී ලංකාවේ ඉඩම් ගැටළු සහ ගැටුම් අතර ඇති සංකීර්ණ අන්තර් ක්‍රියාකාරිත්වය දෙස බලන පර්යේෂණවල නිරත වෙමින් සිටී. ඔවුන් කරන්නේ කුමක්දැයි දැනගැනීමට ඉන්ස්ටග්‍රෑම් සහ ෆේස්බුක් හරහා අප සමග එක්වන්න.

2024 මැයි මාසයේ දී විවෘත කැඳවීමකින් පසුව, SEDR Sri Lanka (ඵලදායිව ආරවුල් නිරාකරණයට සහයවීම) හා හවුල්ව පැවැත්වෙන අපගේ සංවාද සහ ප්‍රජා සබඳතා අධිශිෂ්‍යත්වයට බවනීධා ලෝකනාතන්, චන්තුරු තිවීගන්, කල්‍යාණි සුන්දරම්, සහ තමිලිනි සිත්තිරවඩිවෙල් නම් තරුණ සංස්කෘතික වෘත්තිකයින් සිව්දෙනා අපි පිළිගත්තෙමු. මෙම අධිශිෂ්‍යත්ව ඉලක්ක කරන්නේ ප්‍රජා සංවාද සහ විකල්ප ආරවුල් නිරාකරණ (ADR) ප්‍රවේශ ප්‍රවර්ධනය කිරීමෙහිලා උනන්දුවක් දක්වන ශ්‍රී ලංකාවේ උතුර, නැගෙනහිර, සහ ඌව පළාත්වල සංස්කෘතික වෘත්තිකයන් (කලාකරුවන්, ක්‍රියාකාරීන්, ලේඛකයින්, කිවිඳන්, පහසුකම් සලසන්නන්, අභිවාහකයින්, සහ අධ්‍යාපනඥයින්) වේ.

'කෞතුකාගාර තීව්‍ර' නම් අපගේ වෘත්තීය පුහුණු වැඩසටහනේ දෙවන සංස්කරණය ජුනි 27 වන දා 'කඩදාසි සහ ඡායාරූප සංරක්ෂණය'' යන මැයින් පැවැත්විණ. ලෝක ස්මාරක අරමුදල සමඟ එක්ව නිර්මාණය කළ මෙම වැඩමුළුව ශ්‍රී ලංකාව පුරා සංවිධාන 11ක කෞතුකාගාර සහ ගැලරි වෘත්තිකයින් 15 දෙනෙකු පිළිගත්තේ ය.

'Museum Intensive II: Paper and Photography Conservation' කඩදාසි පදනම් කරගත් ද්‍රව්‍ය රැකබලාගැනීම සහ කඩදාසි දිරාපත්කළ හැකි කාරකයන් පිළිබඳ හැඳින්වීමක් සැපයීය. පරිහරණය, ගබඩාකිරීම, සහ පිරියම් වර්ග පිළිබඳ අවධානය යොමුකළ පුහුණුවක් ද ඊට ඇතුළත් විය. City & Guilds of London Art Schoolහි විදුහල්පති ආචාර්ය ලොයිස් රෝව් සහ City & Guilds of London Art Schoolහි Book and Paper Conservation පාඨමාලාවේ උපදේශක සහ එංගලන්තයේ ජාතික භාරකාර මණ්ඩලයේ කඩදාසි සහ ඡායාරූපකරණය භාර ජ්‍යෙෂ්ඨ සංරක්ෂක නිකොලා වෝල්කර් විසින් මෙම සැසි මෙහෙයවන ලදී.

තවත් උද්වේගකර පුවතක් වන්නේ MMCA ශ්‍රී ලංකා විසින් 2024 අගෝස්තු මාසයේදී අපගේ පළමු පර්යේෂණ ප්‍රකාශනය වන 'දෙවැනි වෙළුමේ' සිංහල සහ දෙමළ අනුවාද එළිදැක්වීමයි. 'දෙවැනි වෙළුම' 'අක්කර 88' ට සමගාමීව සංකල්පනය කර ඇති අතර 2024 පෙබරවාරි මාසයේ දී ප්‍රකාශයට පත්කරන ලදී. මෙම අලුත් සිංහල සහ දෙමළ ප්‍රකාශන සැමට විවෘත සහ නොමිලේ බාගත හැකි ඊ-පොත් ලෙස අපගේ වෙබ් අඩවියේ ඇත. ඒවා නිකුත් වන තෙක් රැඳී සිටින්න!

අපගේ ආරම්භක අනුග්‍රාහකයෝ පිරිසක් ජූලි 12–14 දින දක්වා අභිරක්ෂණය කළ කලා චාරිකාවකට සහභාගී වීමට මඩකලපුව ප්‍රදේශයට ගියහ. ශ්‍රී ලංකාවේ නැගෙනහිර

වෙරළ තීරය දක්වා ගිය මෙම සංචාරය, රටේ සමකාලීන කළා ක්ෂේත්‍රයේ ප්‍රබෝධයට දායක වන කොළඹින් බැහැරව සිටින බොහෝ කලාකරුවන් සහ නව කාර්යයන්වල වැදගත්කම අවධාරණය කළේ ය.

මැයි මාසයේ ‘Condé Nast Traveller’ වෙනුවෙන් ලියමින් ආදිලාහ් ඉස්මයිල් පැවසුයේ MMCA ශ්‍රී ලංකා ‘කොළඹ තුළ අනිවාර්ය ගමනාන්තයක්’ බවයි. ඉදිරි මාස කිහිපය තුළ ඔබ ශ්‍රී ලංකාවට පැමිණීමට අදහස්කරන්නේ නම්, ඔබේ අනිවාර්යයෙන් සංචාරය කළ යුතු තැන්වල ලැයිස්තුවට අපිව ඇතුළත් කරන්න අමතක කරන්න එපා!

අවසාන වශයෙන්, ශ්‍රී ලංකාවේ, ස්වීඩනයේ, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ, නෙදර්ලන්තයේ. සහ ඇමරිකා එක්සත් ජනපදයේ වෙසෙන සමකාලීන ශ්‍රී ලාංකික කලාකරුවන් 29 දෙනෙකුගේ නිර්මාණ ප්‍රදර්ශනය කරන, සන්දේවි හැන්ඩි සහ තිනාල් සජීව විසින් අභිරක්ෂණය කරන ලද ‘බිම් පෙරළිය’ නම් අපගේ මීළඟ ප්‍රදර්ශනය සැප්තැම්බර් 12 වන දින විවෘත වීමට නියමිත බව අප සතුටින් දැනුම් දෙමු. වැඩි විස්තර සඳහා ඉන්ස්ටග්‍රෑම් සහ ෆේස්බුක්හි හරහා අප හා එක්වන්න.